(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 454.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 මැයි මස 19 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4824/'14

1\.

ගරු බුද්ධික පතිරණ මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා යුද හමුදාව විසින් කුලී පදනම මත ලබා ගත්, වායු සමනය කළ, සුඛෝපභෝගී වාහන යුද හමුදා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා යොදා ගන්නා බවත්;

(ii) එම වාහන සඳහා ඉන්ධන රජයෙන් ලබා ගන්නා බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කුලී පදනම මත ලබා ගත්, සුඛෝපභෝගී වාහන ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ පෞද්ගලික පරිහරණය සඳහා යොදා ගැනීමට ශ්‍රී ලංකා යුද හමුදාවේ සහ ආරක්ෂක අමාත්‍යාංශයේ එකඟතාවය ලබා දී තිබේද;

(ii) නොඑසේ නම්, එම වාහන පරිහරණය පිළිබඳව පරීක්ෂණයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම පරීක්ෂණයේ ප්‍රතිඵල කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5580/'14

2\.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ආයුර්වේද වෛද්‍යවරු සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන සේවා ව්‍යවස්ථාව සකසන ලද වර්ෂය කවරේද;

(ii) එම සේවා ව්‍යවස්ථාව අවසන් වරට සංශෝධනය කළ වර්ෂය කවරේද;

(iii) එය සංශෝධනය නොකළේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5943/'15

3.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 06/2011 චක්‍රලේඛය අනුව ජනාධිපති, අගමැති, කථානායක, කැබිනට් අමාත්‍ය, විපක්ෂ නායක, නියෝජ්‍ය අමාත්‍ය, නියෝජ්‍ය කථානායක, නියෝජ්‍ය කාරක සභා සභාපති, ව්‍යාපෘති අමාත්‍ය, දිස්ත්‍රික් හා රාජ්‍ය අමාත්‍ය, කැබිනට් අමාත්‍යාංශ ලේකම්, පළාත් සභාවක ප්‍රධාන ලේකම්, භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් යනාදී තනතුරුධාරීන්ගේ ලේකම්වරුන්ට විශ්‍රාම වැටුප් හිමිකම ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී විශ්‍රාම වැටුප් හිමිකම ලබාදීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශය හා මේ වන විට එකී විශ්‍රාම වැටුප සම්බන්ධව වලංගුව පවතින සියලු චක්‍රලේඛ හා උපදෙස්වල තොරතුරු ඇතුළත් ගොනුවක් ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) මේ වන විට ඉහත සඳහන් විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ ලබා ගන්නා පිරිස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6034/'15

4.

ගරු විජිත හේරත් මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හෝමියෝපති පනත අනුව වර්ෂ 2006 - 2011 දක්වා කාල සීමාව සඳහා පත්කර තිබූ හෝමියෝපති වෛද්‍ය සභාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 සහ 14 වගන්තිවලට පටහැනිව 2009.10. 29 දින විසුරුවා හැර ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් 2006 වර්ෂයේ පත්වූ එකී වෛද්‍ය සභාවේ සාමාජිකයන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති බවත්;

(iii) විසුරුවන ලද වෛද්‍ය සභාව වෙනුවට එවකට විෂයභාර අමාත්‍යවරයා විසින් නීත්‍යානුකූල නොවන අතුරු කමිටුවක් පත් කළ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (iii) හි සඳහන් පත් කිරීම අනුමත කරන්නේද;

(ii) එම අතුරු කමිටුව විසින් සිදු කළ අංක 184 සිට 275 දක්වා වෛද්‍යවරුන් ලියාපදිංචිය තුළින් හෝමියෝපති පනත උල්ලංඝනය වී තිබේද;

(iii) එසේ නම්, එම පත්වීම් අවලංගු කරන්නේද;

(iv) අවලංගු කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) හෝමියෝපති පනතේ 20 වැනි වගන්තිය යටතේ ලේඛකාධිකාරීවරයෙකු පත්කිරීමට වෛද්‍ය සභාවකට පමණක් ඇති බලය අභිබවා එවකට පැවති දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් එම්. ඒ. පෙරේරා මහතාව ලේඛකාධිකාරී ලෙස පත්කිරීම නීත්‍යානුකූල වන්නේද;

(ii) නොඑසේ නම්, එම පත්කිරීම නිවැරදි කිරීමට ගන්නා පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6039/’15

5\.

ගරු වාසුදේව නානායක්කාර මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය මගින් සංවිධානය කර තිබූ 2015 දැයට කිරුළ වැඩසටහන යටතේ රත්නපුර දිස්ත්‍රික්කය සඳහා වූ නිවාස ආධාර වැඩපිළිවෙළට අදාළව ඇහැලියගොඩ ඡන්ද කොට්ඨාසයේ ඇහැලියගොඩ, කිරිඇල්ල හා කුරුවිට යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට අයත් ඉල්ලුම්කරුවන් 1000 වැඩි පිරිසකගෙන් ඉල්ලුම්පත් ලැබී තිබුණේද;

(ii) එකී ඉල්ලුම්පත් අනුව සකසනු ලැබූ ඇස්තමේන්තු මත අදාළ භාණ්ඩ සැපයීම සඳහා මිල ගණන් හෝ ටෙන්ඩර් කැඳවීමේ කාර්යය රත්නපුර දිස්ත්‍රික් ලේකම්වරයා වෙත යොමු කර තිබුණේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට එම නිවාස ආධාර බලාපොරොත්තුවෙන් සිටින අඩු ආදායම්ලාභීන් එම ආධාර වැඩපිළිවෙළ වත්මන් රජය විසින් අවලංගු කර තිබේදැයි විමසන බව නිලධාරින් ඇතුළු වගකිවයුත්තන් දන්නේද;

(ii) ඒ පිළිබඳව අදාළ නිලධාරීන්ගෙන් විමසා බලා තොරතුරු ලබා ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6041/’15

6\.

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි මාසයේ පැවති මිලට සාපේක්ෂව මේ වන විට සාදික්කා මිල 30% - 40% අතර ප්‍රමාණයකින් පහළ ගොස් ඇති බව දන්නේද;

(ii) එලෙස සාදික්කා මිල පහළ යෑමට හේතුව කවරේද;

(iii) නිරන්තරයෙන් සිදුවන සාදික්කා මිල පහළ වැටීම වළක්වා ගැනීමට යම් පියවරක් ගෙන තිබේද;

(iv) එසේ නම්, එම පියවර පැහැදිලි කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය අයවැයට සාපේක්ෂව මෙවර අයවැයෙන් අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන 50%කින් පමණ අඩුකර ඇති බව දන්නේද;

(ii) ප්‍රතිපාදන අඩු කිරීම හේතුවෙන් අපනයන කෘෂිකර්මාන්තයන්හි සිදුවන පසුබෑම මග හරවා ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6043/’15

7\.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය මහනගර සභාව සඳහා අලුතින් ඉදිකිරීමට නියමිත ගොඩනැගිල්ලට වෙන් කර ඇති මුදල කොපමණද;

(ii) එහි පළමුවැනි අදියරේ වැඩ කටයුතු ආරම්භ කර තිබේද;

(iii) එම පළමුවැනි අදියර සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

6048/'15

8\.

ගරු සී. ඒ. සූරියආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) තඹලගමුව ප්‍රාදේශීය සභාව විසින් පුරාවිද්‍යාත්මක ස්ථාන විවිධ පොදු අවශ්‍යතා වෙනුවෙන් යොදා ගැනීමේ වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) තඹලගමුව, යුනිට් 17 කොලනියේ තිබූ පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුත් දාගැබ් දෙකක නටඹුන් වනසමින් ළමා උද්‍යානයක් ඉදිකළේ කෙසේද;

(ii) ඊට එරෙහිව නීතිය ක්‍රියාත්මක නොවූයේ මන්ද;

(iii) තඹලගමුව - තිස්සපුර ග්‍රාමයේ, පිඹුරු අංක ශ්‍රී 51 අතිරේක අංක 16, පත්‍ර අංක 16, කැබලි අංක 576 යන පුරාවිද්‍යාත්මක භූමිය ආසන්නයේ පිහිටි සුසානභූමිය පුළුල්කිරීම මුවාවෙන් කම්බි ගසා වෙන්කර ගැනීමට කරන උත්සාහය කවර පදනමක් මත, කුමන පාර්ශ්වයකගේ අවශ්‍යතාවයකට සිදු කරන්නේද;

(iv) භික්ෂූන්වහන්සේලා ප්‍රමුඛ ප්‍රදේශවාසීන් ඊට විරෝධය පෑමෙන් පසු එකී පුරාවිද්‍යා භූමිය ඔස්සේ කුඹුරුවලට යාමට තිබූ මාර්ගය අවහිර කරමින් වැටක් ඉදිකිරීම කවර පාර්ශ්වයකින් පලිගැනීම සඳහා සිදු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) නැගෙනහිර පළාතේ බෞද්ධ නටඹුන් විනාශ කිරීමට පළාත් පාලන ආයතනවලට ඉඩදීමට හේතුව කවරේද;

(ii) එවැනි සිදුවීම් සම්බන්ධව පුළුල් පරීක්ෂණයක් සිදුකර ඊට සම්බන්ධ හෝ අනුබල දුන් පුද්ගලයන්ට එරෙහි ක්‍රියාමාර්ග ගන්නේ ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4828/'14

9\.

ගරු බුද්ධික පතිරණ මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතර මහ රෝහලට තම ප්‍රථම පත්වීම ලැබූ එහි ප්‍රධාන හෙද නිලධාරිනිය වන මල්කාන්ති ද සිල්වා මහත්මිය මේ වන විට ස්ථාන මාරුවීම්වලින් තොරව එම රෝහලේම වර්ෂ 21 ක් පමණ සේවය කර ඇති බවත්;

(ii) එම හෙද නිලධාරිනිය අවස්ථා කිහිපයකදී ස්ථාන මාරුවීම් ඉල්ලා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රජයේ හෙද සේවයේ නියුතු වූ අයට ස්ථාන මාරුවීම් ලබා දීමේදී රජය අනුගමනය කරනු ලබන ප්‍රතිපත්තිය කවරේද;

(ii) ඉහත අ (ii) හි පරිදි ස්ථාන මාරුවීම ඉල්ලා තිබියදීත්, රජයේ හෙද ස්ථාන මාරු ලබා දීමේ ප්‍රතිපත්තිය මල්කාන්ති ද සිල්වා මහත්මියට වලංගු නොවීමට හේතු කවරේද;

(iii) අදාළ ස්ථාන මාරුවීම් ලබා දීමේ ප්‍රතිපත්තියට අනුව ඇයට ස්ථාන මාරුවීමක් ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, ඇයට, ඇය ඉල්ලුම් කරන ස්ථානයට ස්ථාන මාරුවීමක් දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5581/'14

10.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වත්මන් ආයුර්වේද වෛද්‍ය කොමසාරිස්වරයාගේ අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(ii) එම නිලධාරියාට ආයුර්වේද වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් ඇති සුදුසුකම් කවරේද;

(iii) ආයුර්වේද වෛද්‍ය උපාධිධාරියෙකුට සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය තුළ ලබා ගත හැකි ඉහළම වෘත්තීයමය තනතුර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5944/'15

11.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය, කොඩ්බේහි පිහිටි ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන ආයතනයට (NARA) අයත් නිලධාරි නිවස්නය ශ්‍රී ලංකා නාවික හමුදාවේ පරිහරණයට ලබා දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ත්‍රිකුණාමලය හා තදාසන්න ප්‍රදේශවල රාජකාරි කටයුතුවල නියැලීමේදී, නාරා ආයතනයේ පර්යේෂකයන්ට ප්‍රයෝජනයට ගැනීමට තිබූ ඉහත සඳහන් නිවස්නය සිවිල් පරිපාලනය ස්ථාපනය වී ඇති අවස්ථාවක තවදුරටත් නාවික හමුදාව භාරයේ තැබීමේ අවශ්‍යතාවයක් තිබේද;

(ii) එම නිවස්නය යළි නාරා ආයතනයට පවරා නොගන්නේද;

(iii) එම පවරා ගැනීම සිදු කරන්නේ නම්, එම දිනය කවරේද;

(iv) එම නිවස්නය යළි නාරා ආයතනයට පවරා ගන්නා තෙක්, නාරා ආයතනයේ පර්යේෂකයන්ට හා නිලධාරීන්ට එම ප්‍රදේශයේ රාජකාරි කිරීමේ දී නවාතැන් පහසුකම් සලසා දෙන්නේ කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6042/'15

12.

ගරු එරික් ප්‍රසන්න වීරවර්ධන මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එවකට පැවති ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් යොවුන් සේනාංක සහ රැකියා මාර්ගෝපදේශ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා පසුගිය වර්ෂයේදී හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය යටතේ මුදල් වෙන් කළ බවත්;

(ii) එම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කර මේ වන විට අඩක් නිම වී ඇති බවත්;

(iii) වත්මන් රජය විසින් එම ව්‍යාපෘතිය නවතා දමා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) හාරිස්පත්තුව ප්‍රදේශයේ අනාගත දරු පරපුරේ යහපත උදෙසා ඉහත සඳහන් ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6045/'15

13\.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කය තුළ මාර්ග සංවර්ධන අධිකාරිය යටතේ ඇති මාර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම මාර්ග අතරින් අළුත්වැඩියා කිරීමට නියමිත මාර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) එකී මාර්ග අළුත්වැඩියාවට අදාළව ව්‍යාපෘති හඳුනා ගෙන තිබේද;

(iv) එසේ නම්, එම ව්‍යාපෘති සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(v) එම ව්‍යාපෘතිවලට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4829/'14

14\.

ගරු බුද්ධික පතිරණ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාතර දිස්ත්‍රික්කයේ, කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කරගොඩ උයන්ගොඩ I අත හා II අත ඇතුළු ග්‍රාම නිලධාරී වසම් කිහිපයක වගා අස්වනුවලට වඳුරන්ගෙන් සහ මොනරුන්ගෙන් සිදුවන හානි වළක්වාගත නොහැකි වීම නිසා කෘෂිකාර්මික කටයුතුවල නියුතු ප්‍රදේශවාසීන් දැඩි අපහසුතාවට පත්වී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වගාවන්ට සිදුවන හානි වැළැක්වීම සඳහා දැනට ගෙන ඇති පියවර කවරේද;

(ii) ඒ සඳහා ඉදිරියේදී අනුගමනය කරන ක්‍රමවේදයන් කවරේද;

(iii) මෙම වගාවන් ආරක්ෂා කරදීම සඳහා කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5945/'15

15\.

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DODD/HO/2/Admin/පත්කිරීම් හා 2015.02.05 දිනැති ලිපියෙන් යූ. අනුර එස්. වීරරත්න මහතා (ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ I) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ තනතුරට පත් කර ඇති බවත්;

(ii) පසුව එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (පාලන)ගේ අංක DODD/HO/2/ Admin/පත්කිරීම් හා 2015.02.19 දිනැති ලිපියෙන් එකී පත් කිරීම නැවත සංශෝධනය කරමින් ඒ මහතාව එකී දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ, අධ්‍යක්ෂ (ප්‍රජා මූල සංවිධාන) තනතුරට පත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වීරරත්න මහතාට ඉහත (අ) (i) හි සඳහන් තනතුර ලබා නොදීමට ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම්වරයාගේ සහ සමෘද්ධි විෂයයට අදාළ නොවන අමාත්‍යවරයෙකුගේ දේශපාලන මැදිහත්වීමක් සිදුවී තිබේද;

(ii) එවැනි මැදිහත්වීමක් සිදුවී ඇත්නම්, එය අනුමත කරන්නේද;

(iii) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ සමෘද්ධි විෂයට අදාළ කටයුතු ඉඩම් අමාත්‍යවරයාට පවරා තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ තනතුර සඳහා යූ. අනුර එස්. වීරරත්න මහතා පත් කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අධිකරණ අමාත්‍යතුමා,— සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ නියමය,— 2002 අංක 25 දරන සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය යටතේ අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මාර්තු 17 දිනැති අංක 1906/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*2.

ආගාමික හා විගාමික (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*3.

ජාතික ගුරු අධ්‍යාපන අධිකාරිය (ඉවත් කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

දේශීය ආදායම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*5.

එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*6.

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*7.

මුදල් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*8.

ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*9.

විදුලි සංදේශ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*10.

ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 1),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 32 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 32 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 30602 "දුම්රිය ගබඩා අත්තිකාරම් ගිණුම - දුම්රිය දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | |
|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 1,700,000,000 සිට රු. 2,200,000,000 දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 6,102,000,000 සිට රු. 6,602,000,000 දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 850,000,000 සිට රු. 1,000,000,000 දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 2),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 33 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 33 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 24702 "අත්අඩංගුවට ගන්නා ලද හා රාජ සන්තක කරන ලද බඩු ද්‍රව්‍ය පිළිබඳ වියදම් අත්තිකාරම් ගිණුම - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | රු. 20,000,000<br>රු. 25,000,000 | සිට<br>දක්වා |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 3),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 34 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 34 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 21302 "පොත් මුද්‍රණය, ප්‍රචාරණය හා අලෙවිය (ප්‍රකාශන අයිතිය ප්‍රසිද්ධ කිරීම, පරිවර්තන හිමිකම් මිලට ගැනීම හා කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ඇතුළුව) අත්තිකාරම් ගිණුම - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | රු. 2,900,000,000<br>රු. 2,500,000,000 | සිට<br>දක්වා |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | රු. 1,500,000,000<br>රු. 2,250,000,000 | සිට<br>දක්වා |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 4),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 35 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 35 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31002 "ගබඩා අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 120,000,000<br>රු. 170,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත | |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත | |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 5),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද පහත දැක්වෙන අංක 36 දරන නියමය අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ අංක 36 දරන නියමය

මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පවරනු ලැබ ඇති බලතල ප්‍රකාරව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එකී පනතේ තෙවැනි උපලේඛනයේ විෂය අංක: 31003 " කළ වැඩ අත්තිකාරම් ගිණුම - රජයේ කර්මාන්ත ශාලාව" වෙත පැවරී ඇති කාර්යය වෙනුවෙන් නිශ්චිතව දක්වා ඇති සීමාවන්, මෙම නියමය මගින් සංශෝධනය කරමි.

| | | | |
|---|---|---|---|
| (i) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ II වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති වියදමෙහි උපරිම සීමාව | රු. 260,000,000<br>රු. 450,000,000 | සිට<br>දක්වා |
| (ii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ III වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති ලැබීම්වල අවම සීමාව | සංශෝධන නොමැත | |

| | | |
|---|---|---|
| (iii) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ IV වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති හර ශේෂයන්ගේ උපරිම සීමාව | සංශෝධන නොමැත |
| (iv) | එකී පනතේ තෙවැනි උපලේඛනයේ V වැනි තීරයෙහි නිශ්චිතව දක්වා ඇති බැරකම්හි උපරිම සීමාව | සංශෝධන නොමැත |

(මෙම නියමය වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි)

අත්සන් කළේ/ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015.04.10 වැනි දින,
කොළඹ 01.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

මුදල් අමාත්‍යතුමා,— විසර්ජන පනත යටතේ යෝජනාව (අංක 6),— 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යතුමාට පැවරුන බලතල අනුව, ආණ්ඩුවේ අනුමතිය ඇතිව, එතුමා විසින් දෙන ලද මෙහි පහත උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති නියමයන් අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(මෙම නියමයන් වලංගු වන්නේ 2014.12.31 වැනි දින දක්වා පමණි.)

## උපලේඛනය
## 2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය අනුව කරන විධානය

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වැනි වගන්තිය යටතේ 2014 මුදල් වර්ෂය සඳහා රාජ්‍ය නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් මුදල් අමාත්‍යතුමා විසින් බලය දෙන සීමා වෙනස් කිරීමේ උපලේඛනය.

### කණ්ඩායම් විධාන අංක 01

2013 අංක 36 දරන විසර්ජන පනතේ 8 වන වගන්තිය අනුව මට පැවරී ඇති බලතලවලට අනුව රවී කරුණානායක වන මම, මුදල් අමාත්‍යවරයා වශයෙන් රජයේ අනුමතියට යටත්ව මේ සමග දක්වා ඇති උපලේඛනයේ දැක්වෙන ආකාරයට රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්වල පහත දැක්වෙන විෂය අංකවලට අදාළ වන්නා වූ පනතේ තෙවන උපලේඛනයේ තීරු අංක II සහ IV හි දක්වා ඇති උපරිම සීමාවන් සහ අංක IIIහි දක්වා ඇති අවම සීමාවන් සංශෝධනය කරමි. 14001, 18201, 10501, 22801, 20801, 27701, 30301, 26901, 27001, 27201, 24201, 28601, 10201, 25601, 25801, 28201, 28501, 11601, 28801, 30601, 27901, 27801, 27401, 27501, 21901, 17801, 12601, 11101, 18801, 21101 සහ 19001.

| අනු අංකය | අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | විෂය අංකය | II රජයේ කටයුතු සඳහා වියදමෙහි උපරිම සීමාව | | III රජයේ කටයුතු පිළිබඳ ගිණුම්වලට බැර කළ යුතු ලැබීම්වල අවම සීමාව | | IV රජයේ කටයුතුවල හර ශේෂයන්ගේ උපරිම සීමාව | | නියෝග අංකය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | සිට | දක්වා | සිට | දක්වා | සිට | දක්වා | |
| | | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| 1 | පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 14001 | 7,000,000 | 10,000,000 | 3,700,000 | 4,000,000 | - | - | 1 |
| 2 | විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යාංශය | 18201 | 5,000,000 | 8,000,000 | 1,100,000 | 4,100,000 | - | - | 2 |
| 3 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 10501 | 140,000,000 | 170,000,000 | 60,000,000 | 90,000,000 | - | - | 3 |
| 4 | අධිකරණ අමාත්‍යාංශය | 22801 | 260,420,000 | 290,420,000 | 170,000,000 | 175,000,000 | 850,000,000 | 1,100,000,000 | 4 |
| 5 | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව | 20801 | 9,000,000 | 12,000,000 | - | - | - | - | 5 |
| 6 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මොණරාගල | 27701 | - | - | 25,000,000 | 24,000,000 | - | - | 6 |
| 7 | පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව | 30301 | - | - | 3,000,000 | 2,900,000 | - | - | 7 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 8 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - මඩකලපුව | 26901 | - | - | 23,000,000 | 18,000,000 | 90,000,000 | 100,000,000 | 8 |
| 9 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය / කච්චේරිය - අම්පාර | 27001 | - | - | 35,000,000 | 30,000,000 | - | - | 9 |
| 10 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල | 27201 | - | - | 75,000,000 | 65,000,000 | - | - | 10 |
| 11 | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව | 24201 | - | - | 2,000,000 | 1,700,000 | - | - | 11 |
| 12 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 28601 | - | - | 12,000,000 | 11,500,000 | - | - | 12 |
| 13 | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය | 10201 | 15,000,000 | 12,000,000 | 9,500,000 | 8,500,000 | - | - | 13 |
| 14 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ | 25601 | - | - | 56,000,000 | 53,000,000 | - | - | 14 |
| 15 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මහනුවර | 25801 | - | - | 51,000,000 | 46,000,000 | - | - | 15 |
| 16 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 28201 | - | - | 100,000,000 | 97,000,000 | - | - | 16 |
| 17 | කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 28501 | - | - | 150,000,000 | 120,000,000 | - | - | 17 |
| 18 | සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 11601 | 6,000,000 | 7,500,000 | - | - | - | - | 18 |
| 19 | මිනුම්පති දෙපාර්තමේන්තුව | 28801 | - | - | 100,000,000 | 86,000,000 | - | - | 19 |
| 20 | ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව | 30601 | - | - | 385,000,000 | 290,000,000 | - | - | 20 |
| 21 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කෑගල්ල | 27901 | - | - | 30,000,000 | 26,000,000 | - | - | 21 |
| 22 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - රත්නපුර | 27801 | - | - | 38,000,000 | 32,000,000 | - | - | 22 |
| 23 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අනුරාධපුර | 27401 | - | - | 40,000,000 | 35,000,000 | - | - | 23 |
| 24 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - පොලොන්නරුව | 27501 | - | - | 18,000,000 | 15,000,000 | - | - | 24 |
| 25 | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | 21901 | 8,000,000 | 8,011,000 | - | - | - | - | 25 |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 26 | පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය | 17801 | 4,000,000 | 5,000,000 | - | - | - | - | 26 |
| 27 | අධ්‍යාපන අමාත්‍යාංශය | 12601 | - | - | 680,000,000 | 675,000,000 | - | - | 27 |
| 28 | සෞඛ්‍ය අමාත්‍යාංශය | 11101 | - | - | 710,000,000 | 653,000,000 | - | - | 28 |
| 29 | උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය | 18801 | 2,000,000 | 2,060,110 | - | - | - | - | 29 |
| 30 | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව | 21101 | - | - | 45,000,000 | 44,000,000 | - | - | 30 |
| 31 | නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය | 19001 | - | - | 83,000,000 | 60,000,000 | - | - | 31 |
| | එකතුව | | 456,420,000 | 524,991,110 | 2,905,300,000 | 2,666,700,000 | 940,000,000 | 1,200,000,000 | |

අත්සන් කළේ රවී කරුණානායක,
මුදල් අමාත්‍යතුමා.

2015 අප්‍රේල් 10 දින
කොළඹ 01.



(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව (අංක 1),— (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ, ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2015.04.07 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2015 ජනවාරි 29 දිනැති අංක 1899/33 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

මුදල් අමාත්‍යතුමා,— රේගු ආඥාපනත යටතේ යෝජනාව (අංක 2),— (235 වැනි අධිකාරය වූ) රේගු ආඥාපනතේ 10 වැනි වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් 2015.04.07 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/40 දරන අති විශේෂ ගැසට් පත්‍රය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 02 දිනැති අංක 1891/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 12 දිනැති අංක 1892/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2014 දෙසැම්බර් 31 දිනැති අංක 1895/11 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජනවාරි 22 දිනැති අංක 1898/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 ජනවාරි 29 දිනැති අංක 1899/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 14 දිනැති අංක 1901/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 7),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 24 දිනැති අංක 1903/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

මුදල් අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 8),— 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 මාර්තු 17 දිනැති අංක 1906/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වැනි වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු, එම පනතේ 20 වැනි වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.07 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2015 පෙබරවාරි 26 දිනැති අංක 1903/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.04.27 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*29.

මුදල් අමාත්‍යතුමා,— දේශීය ආදායම් පනත යටතේ යෝජනාව,— 2015.04.27 වැනි දින ඉදිරිපත් කරන ලද, ආදායම් මත වූ බදු සම්බන්ධයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීම සහ බදු පැහැර හැරීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ සිංගප්පූර් ජනරජයේ ආණ්ඩුව අතර, 2014 අප්‍රේල් මස 03 වැනි දින ඇතිකරගත් ගිවිසුම, 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 97(1)(අ) වගන්තිය යටතේ අනුමත කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*30.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී

ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*31.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*32.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද, නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*33.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*34.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශ මත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝග (විදුලිබල පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යපටිපාටි) අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*35.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*36.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1].

*37.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

38.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

39.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

40.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

41.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

42.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.